(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 5(7).]

# පාර්ලිමේන්තුවේ අංක 5 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2017 පෙබරවාරි මස 23 වැනි බ්‍රහස්පතින්දා**

---

**2017 මාර්තු මස 07 වැනි අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

ජාතික ගමනාගමන කොමිෂන් සභා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අවලංගු කළ නොහැකි තෑගි ඔප්පු බලවත් අකෘතඥතාවය පදනම් කොටගෙන අවලංගු කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා,— වෙළඳ නැව් පනත යටතේ නියෝග,— 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 139 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 321 වගන්තිය යටතේ බහාලුම් දළ ස්කන්ධ සත්‍යායන සම්බන්ධයෙන් වරාය හා නාවික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 අගෝස්තු 11 දිනැති අංක 1979/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.02.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

**2017 අප්‍රේල් මස 04 වැනි අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

387/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (5)

(අ) (i) 2015 වර්ෂයේදී යුධ හමුදාවට ශාරීරික අභ්‍යාස සඳහා අවශ්‍ය කැන්වස් සපත්තු මිලදී ගැනීමට ටෙන්ඩර් කැඳවූ අවස්ථාවේ ඒ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ ආයතන කවරේද;

(ii) එම ආයතන ඉදිරිපත් කළ ටෙන්ඩර් වටිනාකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ටෙන්ඩරය ලබාගත් ආයතනය කවරේද;

(iv) එම ආයතනයට ටෙන්ඩරය ලබාදීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2015 වර්ෂයේදී මෙම සපත්තු මිලදී ගැනීමට අදාළ ආරක්‍ෂක අමාත්‍යාංශ ටෙන්ඩර් මණ්ඩලයේ සිටි නිලධාරින්ගේ නම් හා තනතුරු කවරේද;

(ii) මෙම නිලධාරින් ටෙන්ඩර් මණ්ඩලයේ කොපමණ කාලයක සිට කටයුතු කරන්නේද;

(iii) 2015 වර්ෂයේදී මෙම සපත්තු මිලදී ගැනීමට අදාළ යුධ හමුදා ටෙන්ඩර් මණ්ඩලයේ සිටි නිලධාරින්ගේ නම් හා තනතුරු කවරේද;

(iv) මෙම නිලධාරින් ටෙන්ඩර් මණ්ඩලයේ කොපමණ කාලයක සිට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ආරක්‍ෂක අමාත්‍යාංශය හා යුධ හමුදා ටෙන්ඩර් මණ්ඩලවල අඛණ්ඩව සේවය කරන නිලධාරින් ඉවත් කිරීමට රජය කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කවර දිනයකදීද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

918/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කැන්විල් හෝල්ඩින්ස් පෞද්ගලික සමාගම (Canwill Holdings (Pvt.) Ltd.) ආරම්භ කළ දිනය කවරේද;

(ii) එහි කොටස් හිමියන් කවුරුන්ද;

(iii) එම කොටස් හිමියන් විසින් සමාගම ආරම්භයේදී ආයෝජනය කළ මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම සමාගමේ ආරම්භක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් කවුරුන්ද;

(v) ආරම්භක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ වැටුප් හා දීමනා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අ(i) හි සඳහන් සමාගමට අනුබද්ධ සමාගම් ආරම්භ කර තිබේද;

(ii) එසේ නම්, එම අනුබද්ධිත සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් කවුරුන්ද;

(iii) ඔවුන්ගේ වැටුප් හා දීමනා කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

959/'16

ගරු බිමල් රත්නායක මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) යාපනය විශ්වවිද්‍යාලයේ දැනට ක්‍රියාත්මක පීඨ සංඛ්‍යාව කොපමණද;

(ii) එහි ක්‍රියාත්මක දෙපාර්තමේන්තු සංඛ්‍යාව කොපමණද;

(iii) එක් එක් පීඨවල සහ දෙපාර්තමේන්තුවල සිටිය යුතු ස්ථිර ආචාර්ය මණ්ඩලය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ස්ථිර ආචාර්ය මණ්ඩලයේ පුරප්පාඩු තිබේද;

(v) එසේ නම්, පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් පීඨය සහ දෙපාර්තමේන්තුව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1000/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2009 මැයි 19 දිනට උතුරු පළාතේ පැවැති යුද, නාවික සහ ගුවන් හමුදා කඳවුරු සංඛ්‍යාව සහ ඒවායේ භූමි ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2015 ජනවාරි 08 දිනට උතුරු පළාතේ පැවැති යුද, නාවික සහ ගුවන් හමුදා කඳවුරු සංඛ්‍යාව සහ ඒවායේ භූමි ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2016 සැප්තැම්බර් 30 දිනට උතුරු පළාතේ පැවැති යුද, නාවික සහ ගුවන් හමුදා කඳවුරු සංඛ්‍යාව සහ ඒවායේ භූමි ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1111/'16

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය නිසා බදුල්ල දිස්ත්‍රික්කයේ ජනතාව විශාල ලෙස පීඩාවට ලක්වී ඇති බව පිළිගන්නේද;

(ii) එසේ නම්, පීඩාවට ලක් වී ඇති පවුල් සංඛ්‍යාව සහ ඔවුන් අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මෙම සංවර්ධන ව්‍යාපෘතිය සිදුකිරීමට පෙර පරිසර ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් ලබාගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කළ මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය මඟින් ලබාදී ඇති තීන්දුවට අනුව අදාළ පුද්ගලයන්ට සහන ලබාදීමට අමාත්‍යාංශය කටයුතු කරන්නේද;

(ii) නොඑසේ නම්, ඒ මන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1140/'16

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, එරාවූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පිහිටුවන ලද දිනය කවරේද;

(ii) ඒ සම්බන්ධයෙන් නිකුත් කරන ලද ගැසට් නිවේදනයේ පිටපතක් සභාගත කරන්නේද;

(iii) එරාවූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මඟින් ආවරණය වන සම්පූර්ණ භූමි ප්‍රමාණය කොපමණද;

(iv) එහි ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාව කොපමණද;

(v) එම ග්‍රාම නිලධාරී වසම්වල නිල අංකයන් හා නාමයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එරාවූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පිහිටුවීමේදී නිල වශයෙන් සීමා නිර්ණය කිරීමක් සිදුවී තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳව විස්තර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එරාවූර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ග්‍රාම නිලධාරී වසම් අතරින් කිසියම් වසමක/වසම්වල පරිපාලන කටයුතු හෝ මෙහෙයවීම් වෙනත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් සිදු කරනු ලබන්නේද;

(ii) එසේ නම්, එම ග්‍රාම නිලධාරී වසම්වල නම්, නිල අංකයන් ඇතුළු විස්තර ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1151/'16

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කොළඹ ප්‍රදේශයෙන් බැහැර කරනු ලබන කැළිකසළ ජා - ඇල ප්‍රදේශයට ගෙන ගොස් දැමීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එවැනි පියවර නිසා ප්‍රදේශයේ ජල මූලාශ්‍රවලට සහ ජන ජීවිතයට විශාල හානියක් සිදුවන බව පිළිගන්නේද;

(iii) ජා - ඇල ප්‍රදේශයේ ජනතාවට අධික පීඩනයක් ගෙන දෙන මෙම ව්‍යාපෘතිය නවතා දැමීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1164/'16

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වවුනියාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සම්පයිමඩු ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, කට්පහපුරම් ග්‍රාමයේ ජනතාව 1990 වර්ෂයේදී යුද්ධය හේතුවෙන් අවතැන්වූ බවත්;

(ii) 2009 වර්ෂයේදී එසේ අවතැන්වූවන්ගෙන් පවුල් 130ක්, කිසිදු මූලික පහසුකමක් නොමැතිව නැවත පදිංචි කළ බවත්;

(iii) මෙතෙක් ඔවුන්ට රජයේ සහන හෝ නිවාස යෝජනා ක්‍රමයක් හෝ නොලැබුණු බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ජනතාවට නිවාස යෝජනා ක්‍රමයක් සහ නැවත පදිංචිවූවන් සඳහා අවශ්‍ය අනිකුත් සහනයන් ලබා දීමට අවශ්‍ය පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1168/'16

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නාවලපිටිය මැතිවරණ බලප්‍රදේශයට අයත් උලපනේ පිහිටි කර්මාන්තපුරය ආරම්භ කිරීම සඳහා පසුගිය රජය විසින් වෙන්කළ මුදල කොපමණද;

(ii) එහි කර්මාන්ත ශාලා කොපමණ ප්‍රමාණයක් ආරම්භ කර ක්‍රියාත්මක වූයේද;

(iii) මේ වනවිට වැසී ගොස් ඇති කර්මාන්තශාලා ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත (අ)(i) හි සඳහන් කර්මාන්තපුරය යළි නගා සිටුවීමට නව වැඩපිළිවෙළක් සකස් කර තිබේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1178/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1983 වර්ෂය වනවිට යාපනය නගරය තුළ පැවති සුළු, මධ්‍යම සහ මහා පරිමාණ ව්‍යාපාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාවෙන් දමිළ ව්‍යාපාරිකයන්ට අයත් ව්‍යාපාර සංඛ්‍යාව කොපමණද;

(iii) සිංහල හෝ වෙනත් ජන වර්ගයක පුද්ගලයන්ට අයත් ව්‍යාපාර සංඛ්‍යාව කොපමණද;

(iv) එහි සම්පූර්ණ වාර්තාවක් මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 1983 වර්ෂයේ දමිළ සහ සිංහල ව්‍යාපාරිකයන් පවත්වාගෙන ගිය ව්‍යාපාර සියල්ලම මේ වනවිටත් ක්‍රියාත්මක වන්නේද;

(ii) නොඑසේ නම්, එම ව්‍යාපාර පවත්වාගෙන ගිය පුද්ගලයන් හෝ ඒවායේ උරුමකරුවන් හෝ යාපනය දිස්ත්‍රික්කය තුළ මේ වනවිටත් ජීවත්ව සිටින්නේද;

(iii) එසේ නම්, එහි සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1218/'16

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) පළාත් පාලන ආයතන විසුරුවා හැර මැතිවරණ නොපවත්වා ගතව ඇති කාලය වසර 1½ ඉක්මවා ඇති බව එතුමා පිළිගන්නේද;

(ii) නව පළාත් පාලන මැතිවරණ පනත ප්‍රකාරව, පසුගිය රජය විසින් සීමා නිර්ණය කොමිසම පත් කරනු ලැබූ දිනය; කොමිසමේ කාලය අවසන් වූ දිනය සහ එම කොමිසමේ නිර්දේශ සළකා බැලීමෙන් අනතුරුව නව සීමා නිර්ණය සහිත කොට්ඨාස ගැසට් කරනු ලබන දිනය; වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වත්මන් රජය විසින් සීමා නිර්ණය කොමිසම පත්කරනු ලැබූ දිනය කවරේද;

(ii) ඔවුන් වෙත ලැබී තිබූ සංශෝධන සංඛ්‍යාව කොපමණද;

(iii) අදාළ සංශෝධන ඉදිරිපත් කළ දිනයන්, පුද්ගලයන් හා ආයතන කවරේද;

(iv) නිවැරදිව නිර්ණය කළ බවට පිළිගත් සංශෝධන නොමැති පළාත් පාලන ආයතන සංඛ්‍යාව කොපමණද;

(v) ඉහත (iv) හි සඳහන් පළාත් පාලන ආයතනවල නම් කවරේද;

(vi) එම පළාත් පාලන බලප්‍රදේශ සඳහා මැතිවරණ පැවැත්වීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1382/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 148 අනුව, හලාවත, මිරිස්ස, කල්මුනේ, වැල්වැටිතුරේ, කරෙයිනගර් සහ පුරාණවැල්ල ධීවර වරායන් 6ක් සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 750 ක් වෙන් කළ බව පිළිගන්නේද;

(ii) ඉහත එක් එක් වරායක් සංවර්ධනය කිරීම සම්බන්ධ ව්‍යාපෘති සඳහා ටෙන්ඩර් කැඳවීමක් සිදු කරනු ලැබුවේද;

(iii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කළ සහ ලබා ගත් ආයතන වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඉහත වරායන් 06 සංවර්ධනය කිරීම සඳහා, 2016.12.31 දින දක්වා මහා භාණ්ඩාගාරය විසින් ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයට ලබා දුන් මුදල කොපමණද;

(v) වර්ෂ 2017 දී ඉහත වරායන් සංවර්ධනය සඳහා ලබා දිය හැකි මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1393/'16

ගරු වාසුදේව නානායක්කාර මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කළුතර සහ වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයන්හි ගොවීන් පොහොර සහනාධාරය ලබා ගැනීමට පැමිණි අවස්ථාවේ සහනාධාර ඉල්ලුම්පත සමඟ ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතු බව අදාළ නිලධාරියා පවසා ඇති බවත්;

(ii) ගොවීන් වැඩි පිරිසකට ජාතික හැඳුනුම්පත් නොමැති බව පැවසූ විට හැඳුනුම්පතේ පිටපතක් අනිවාර්යයෙන් ඉදිරිපත් කළ යුතු බව සඳහන් කරමින් චක්‍රලේඛයක් එවා ඇති බව දැනුම් දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එම ප්‍රදේශයේ ගොවීන් සතු වැඩිහිටි හැඳුනුම්පත්, ගමන් බලපත් හා රියදුරු බලපත් ජාතික හැඳුනුම්පත් වෙනුවට භාර ගන්නා ලෙස නිලධාරින්ට උපදෙස් ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

859/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මත්වතුර පානය ඉහළ ගොස් ඇති බවත්;

(ii) මත්වතුර පානය කිරීම පුද්ගලයන්ගේ සෞඛ්‍ය පිරිහීමට ප්‍රධාන හේතුවක් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මත්වතුර පානය අඩු කිරීමට රජය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

(iii) මත්වතුර පානය කිරීම හේතුවෙන් වැළඳෙන රෝගාබාධයන්ට ප්‍රතිකාර කිරීමට රජය වසරකට වැය කරන මුදල දළ වශයෙන් කොපමණද;

(iv) මෙම මුදල සෞඛ්‍ය සඳහා රජය වැය කරන මුදලින් කොපමණ ප්‍රතිශතයක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

960/'16

ගරු බිමල් රත්නායක මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සබරගමුව විශ්වවිද්‍යාලයේ දැනට ක්‍රියාත්මක පීඨ සංඛ්‍යාව කොපමණද;

(ii) එහි ක්‍රියාත්මක දෙපාර්තමේන්තු සංඛ්‍යාව කොපමණද;

(iii) එක් එක් පීඨවල සහ දෙපාර්තමේන්තුවල සිටිය යුතු ස්ථිර ආචාර්ය මණ්ඩලය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ස්ථිර ආචාර්ය මණ්ඩලයේ පුරප්පාඩු තිබේද;

(v) එසේ නම්, පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් පීඨය සහ දෙපාර්තමේන්තුව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2017 අප්‍රේල් මස 05 වැනි බදාදා
# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

863/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂය තුළ ශ්‍රී ලංකාවට ආනයනය කළ රටඉඳි ප්‍රමාණය කොපමණද;

(ii) ශ්‍රී ලංකාවට රටඉඳි ආනයනය කරන ප්‍රධාන රටවල් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රටඉඳි ආනයනයේදී එහි ප්‍රමිතිය පිළිබඳ පරීක්ෂා කරන්නේද;

(ii) එසේ නම්, ඒ කෙසේද;

(iii) 2015 වර්ෂයේදී රටඉඳි ආනයනය සඳහා වැය කළ මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1066/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් සකසන ලද 2015 – 2020 ක්‍රියාකාරි සැලැස්මෙහි දුම්රිය එංජින් මිලදී ගැනීමට විධිවිධාන සලසා නොමැති වීමට හේතුව කවරේද;

(ii) එකී සැලැස්ම ක්‍රියාත්මක නොකරන්නේ නම්, විකල්ප සැලැස්මක් සකසා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ජාත්‍යන්තර තරඟකාරි මිල කැඳවීමකින් තොරව ඉන්දියාවෙන් දුම්රිය එංජින් මිලදී ගැනීමට සැලසුමක් තිබේද;

(ii) එසේ නම්, එයට හේතු කවරේද;

(iii) ඉන්දියාවේ දුම්රිය එංජින් නිෂ්පාදනය කරන සමාගම්වල නම් කවරේද;

(iv) ජාත්‍යන්තර තරඟකාරි මිල ගණන් නොකැඳවීම යහපාලන මූලධර්මයට එකඟද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1131/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) (වෛද්‍ය) නෙවිල් ප්‍රනාන්දු ආයෝජන පෞද්ගලික සමාගම ශ්‍රී ලංකාව තුළදී වෛද්‍ය උපාධිය පිරිනැමීම සඳහා අවසරය ඉල්ලා තිබේද;

(ii) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ඒ සඳහා අවසරය ලබාදී තිබේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

(iv) අවසර ලබා දීමේ ලිපිය සභාගත කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රුසියාවේ, නිෂ්නි නොව්ගොරොද් රාජ්‍ය වෛද්‍ය විද්‍යාලය (Nizhny Novgorod State University) සමඟ ඒකාබද්ධව උපාධි පිරිනැමීමේ ආයතනයක් ශ්‍රී ලංකාව තුළ පිහිටුවීමට එම සමාගම අවසරය ඉල්ලා තිබේද;

(ii) ඒ සඳහා අවසර ලබාදී තිබේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

(iv) අවසර ලබා දීමේ ලිපිය සභාගත කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) South Asian Institute of Technology and Management නමැති සමාගම South Asian Institute of Technology and Medicine ලෙස සිය ආයතනයේ නම වෙනස් කළ බව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට දැනුම් දී තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1160/'16

ගරු බිමල් රත්නායක මහතා,— තිරසර සංවර්ධන හා වනජීවි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අලිමංකඩක් විවෘත කිරීමේදී සැලකිල්ලට ගන්නා විද්‍යාත්මක පසුබිම කවරේද;

(ii) අලිමංකඩ හරහා වන අලින්ට විවෘත වන ප්‍රදේශයේ පාරිසරික පසුබිම සහ පෝෂණ තත්ත්වය කෙබඳු විය යුතුද;

(iii) අලිමංකඩක් විවෘත කිරීමෙන් බලාපොරොත්තු වන අරමුණු කවරේද;

(iv) පොල්පිතිගම, හක්වටුනාව යෝජිත අලිමංකඩ විවෘත කිරීමෙන් එම අරමුණු ඉටුවේද;

(v) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ප්‍රදේශයේ අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා අලිමංකඩ විවෘත කිරීම බලපාන්නේ කෙසේද;

(ii) යෝජිත අලිමංකඩ, ඉතිහාසයේ සිට පැවතුනු බවට විද්‍යාත්මකව ඔප්පු කළ හැකිද;

(iii) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

(iv) එසේ නම්, එම ප්‍රදේශය රජයේ මැදිහත්වීම යටතේ ජනාවාස බවට පත් කළේ මන්ද;

(v) අවම වශයෙන් මෙය අලිමංකඩක්ව පැවැති බවට දැනුවත් නොකළේ මන්ද;

(vi) සැබවින්ම එය අලිමංකඩක් නම්, ගම්මානයක් බිහිවිය හැකිද;

(vii) කරුවලගස්වැව අලිමංකඩ තුළ ඉදිකළ ජනාවාස අසාර්ථක වූයේ මන්ද:

(viii) ඉබ්බාගමුව දක්වා ගම් වැදුණු වන අලි රක්ෂිතය තුළට පලවා හැරීමට මැදිහත්වන්නේද;

(ix) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1179/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මුලතිව් දිස්ත්‍රික්කය තුළ,

(i) 1983 වර්ෂය වනවිට වගා කරන ලද මුළු ගොවිබිම් ප්‍රමාණය කොපමණද;

(ii) 1982 හා 1983 වර්ෂවල වගා කරන ලද වගාබිම් ප්‍රමාණය එක් එක් බෝගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වර්ෂ 1983න් පසුව 2009 වර්ෂයේ යුදමය තත්ත්වය නිමවන තෙක් වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) යුදමය තත්ත්වය නිමවීමෙන් පසු මේ දක්වා වගා කරන ලද ගොවිබිම් ප්‍රමාණය, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත සියල්ලෙහිම සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1287/'16

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොලිස් නිලධාරින්ගේ සේවය වඩාත් කාර්යක්ෂමව ලබාගනු පිණිසත්, නීතිය හා සාමය සුරැකීම සඳහා ඔවුන් ඉටු කරනු ලබන සේවය අගයනු පිණිසත්, ඉකුත් රජය ඔවුන්ට සහනදායී පදනම මත යතුරුපැදි ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කළ බව දන්නේද;

(ii) එම වැඩසටහන යටතේ 2014.12.31 දක්වා මාතර දිස්ත්‍රික්කයේ සේවය කරනු ලැබූ පොලිස් නිලධාරින් අතරේ බෙදාහැර ඇති යතුරුපැදි සංඛ්‍යාව කවරේද:

(iii) දිස්ත්‍රික්කයේ පොලිස් ස්ථාන අනුව එම සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2015.01.01 දින සිට මේ දක්වා, මාතර දිස්ත්‍රික්කයේ සේවය කරනු ලබන පොලිස් නිලධාරින් අතරේ සහනදායී මිල පදනම මත බෙදා හැර ඇති යතුරුපැදි සංඛ්‍යාව කවරේද;

(ii) එම දිස්ත්‍රික්කයේ පොලිස් ස්ථාන අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) දිස්ත්‍රික්කයේ සේවය කරනු ලබන පොලිස් නිලධාරින් සංඛ්‍යාව, එක් එක් නිලය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) සහනදායි පදනම මත යතුරුපැදි හිමිකම් සහිත දිස්ත්‍රික්කයේ පොලිස් නිලධාරින් අතරින් මෙතෙක් යතුරුපැදි ලබා දී නොමැති පොලිස් නිලධාරින් සංඛ්‍යාව කවරේද;

(v) ඔවුන්ට ඉහත කී යතුරුපැදි ලබා දෙන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1346/'16

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පෙර්පචුවල් ට්‍රෙෂරීස් සමාගම විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ භාණ්ඩාගාර බැඳුම්කර මිලදී ගැනීමේ දී යම් අක්‍රමිකතාවයක් සිදු වී ඇති බව කෝප් වාර්තාව මඟින් වාර්තා කොට ඇති බවත්;

(ii) එම සිද්ධිය සම්බන්ධව 2015 වසරේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂණයක් පැවැත්වූ බවත්;

(iii) එම පරීක්ෂණය සම්බන්ධ වාර්තාව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නාගහමුල්ල යන නිලධාරියා විසින් 2015 ජූනි මස හෝ ඊට ආසන්න කාලයකදී නීතිපතිවරයාගේ උපදෙස් පතා ඉදිරිපත් කරන ලද බවත්;

(iv) එම WPI ලිපි ගොනුව නීතිපති දෙපාර්තමේන්තුවේ අපරාධ අංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරිනියක් වෙත යොමු කරන ලද බවත්;

(v) ඉන් දින කිහිපයකට පසුව එම ලිපි ගොනුව නැවත නීතිපතිවරයා විසින් කැඳවා එම පරීක්ෂණය නවත්වා සිවිල් අංශයේ උසස් නිලධාරියෙකු වෙත භාර දෙන ලද බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එකී ලිපි ගොනුව භාර දෙන ලද නිලධාරිනියගේ නම කවරේද;

(ii) එම නිලධාරිනියගෙන් ලිපිගොනුව ඉවත් කිරීමට හේතුව කවරේද;

(iii) එකී ලිපි ගොනුව පිළිබඳ වර්තමාන ප්‍රගතිය කවරේද;

(iv) අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් සිදු කරන ලද එම පරීක්ෂණය සම්බන්ධයෙන් අපරාධ නීතිය යටතේ කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1392/'16

ගරු වාසුදේව නානායක්කාර මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 සිට මේ දක්වා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සමුද්‍රික අංශය විසින් ශ්‍රී ලාංකික පුරවැසියන් 5200කට අධික පිරිසක් අත් අඩංගුවට ගෙන ඇති බවත්;

(ii) එම පිරිසෙන් බහුතරයක් දැඩි ඇප කොන්දේසි මත මුදාහැර ඇති අතර ඔවුන් රුපියල් 50,000/-, රුපියල් ලක්ෂ 20 සිට ලක්ෂ 40 දක්වා ඇප තැන්පත් කර ඇති බවත්; අනෙක් පිරිස ඇප ලබාගත නොහැකිව බන්ධනාගාරගතව සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) දැඩි ඇප කොන්දේසි පැනවීම නිසා සැකකරුවන්ගේ දරුවන්ට දේපල ලිවීම, බැංකු ණය ගැනීම සහ අන්තිම කැමති පත්‍ර ලිවීම පවා කළ නොහැකි බවත්;

(ii) ඇප මත මුදාහැර ඇති පුද්ගලයන් රටේ විවිධ පළාත්වල පදිංචිකරුවන් වන අතර, සෑම මසකම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණ පොත් අත්සන් කිරීමට සිදුවීමෙන් ඔවුන් පීඩාවට පත් වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) ඔවුන්ට චෝදනා ඇත්නම්, අධිකරණයට ඉදිරිපත් කිරීමට හෝ එසේ නොමැති නම්, මුදා හැරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2017 අප්‍රේල් මස 06 වැනි බ්‍රහස්පතින්දා
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

891/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රන්, රිදී හා යකඩ ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය කරනු ලබන කර්මාන්තකරුවන් පාරම්පරිකව, ජීවත් වන ප්‍රදේශ පිළිබඳ සමීක්ෂණයක් සිදුකර තිබේද;

(ii) එසේ නම්, එම ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව කොපමණද;

(iii) එම ග්‍රාම නිලධාරි වසම්වල, ජීවත්වන උක්ත කර්මාන්තයේ පාරම්පරිකව යෙදෙන පවුල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම කර්මාන්තකරුවන් මුහුණ දෙන ප්‍රධාන ගැටලු පිළිබඳ අධ්‍යයනයක් කර තිබේද;

(v) එසේ නම්, එම ගැටලු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උක්ත කර්මාන්තකරුවන්ට අවශ්‍ය නව තාක්ෂණය හා පුහුණුවීම් ලබාදීමට කටයුතුකර තිබේද;

(ii) එසේ නම්, ඒ කෙසේද;

(iii) නිෂ්පාදන අලෙවි කිරීම සඳහා අවශ්‍ය වෙළඳපොළ සපයාදීමට රජය මැදිහත් වී තිබේද;

(iv) එසේ නම්, ඒ කෙසේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම කර්මාන්තකරුවන් සඳහා විදේශ රැකියා අවස්ථා ලබාදීමට වැඩපිළිවෙළක් තිබේද;

(ii) නොඑසේ නම්, වැඩපිළිවෙළක් සකස් කරන්නේද;

(iii) උක්ත නිෂ්පාදන අපනයනය කරන්නේද;

(iv) එසේ නම්, එම රටවල් කවරේද;

(v) 2015 හා 2016 වර්ෂයන්හිදී මෙම භාණ්ඩ අපනයනයෙන් ලැබූ ආදායම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

952/'16

ගරු බිමල් රත්නායක මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජ්‍ය සේවකයන්ට සහන මිලට යතුරුපැදි ලබාදීමේ වැඩපිළිවෙළ යටතේ තැපැල්කරුවන්ද යතුරුපැදි ඉල්ලා ඇති බවත්;

(ii) ඔවුන්ට මෙතෙක් යතුරුපැදි ලබාදී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම පිරිසට සහන මිලට යතුරුපැදි ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1067/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහව සිට වවුනියාව දක්වා දුම්රිය මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා එවකට අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍ය ගරු රංජිත් මද්දුම බණ්ඩාර මහතා විසින් 2015 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල සන්දේශයක් ඉදිරිපත් කළ බවත්;

(ii) ඒ අනුව ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් රේල් පීලි සහ පාලම්, කොටස් වශයෙන් ආනයනය කර දෙපාර්තමේන්තුව විසින් හෝ දේශීය කර්මාන්තකරුවන් හරහා එකී දුම්රිය මාර්ගය ඉදි කිරීමට සැලසුම් කර තිබූ බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ජාත්‍යන්තර තරඟකාරී මිල ගණන් කැඳවීමකින් තොරව ඉන්දියානු කර්මාන්තකරුවන්ට දුම්රිය මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම භාර දීමට තීරණයකර තිබේද;

(ii) එසේ නම්, එම තීරණයට බලපෑ හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1170/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 සැප්තැම්බර් සිට 2015 පෙබරවාරි දක්වා කාලයේදී ලංකා සතොස මඟින් ආනයනය කරනු ලැබූ සහල් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(iii) එක් එක් ආයතනය ඉදිරිපත් කළ මිල ගණන් කවරේද;

(iv) ආනයනික සහල් නිෂ්කාශනය කිරීම හා ප්‍රමාද ගාස්තු වෙනුවෙන් ශ්‍රී ලංකා රේගුවට සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියට ගෙවනු ලැබූ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) සහල් කිලෝවක ආනයනික මිල සහ විකුණුම් මිල වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) ඒ අනුව ලංකා සතොසට සිදුවූ අලාභය කවරේද;

(vii) මෙම තොගයෙන් විකුණනු ලැබූ සහල් ප්‍රමාණය කොපමණද;

(viii) නරක් වූ සහල් ප්‍රමාණය සහ සහල් සත්ව ආහාර ලෙස විකිණීමට කැබිනට් අනුමතිය ලැබුනු දිනය කවරේද;

(ix) එසේ විකිණූ සහල් ප්‍රමාණය, කිලෝවක විකුණුම් මිල සහ සිදු වූ අලාභය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(x) සත්ව ආහාර ලෙස එම නරක් වූ සහල් මිලදී ගත් ආයතනය සහ ප්‍රමාණය කවරේද;

(xi) සහල් ආනයනයේ සිට විකිණීම දක්වා සමස්ත ක්‍රියාවලිය තුළ ලංකා සතොස වියදම් කළ මුදල, ඉපයූ මුදල හා අලාභය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1237/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ 1983 වර්ෂය වනවිට පැවැති මුළු මාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායින් තාර දමා තිබූ මාර්ග සංඛ්‍යාව සහ කි.මී. ප්‍රමාණය කොපමණද;

(iii) වර්ෂ 1983 සිට යුද්ධය නිම වනතුරු එම දිස්ත්‍රික්කය තුළ මාර්ග ඉදිකිරීම සඳහා, පැවති රජයන් විසින් වියදම් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) යුද්ධය නිම වීමෙන් පසු මෙම දිස්ත්‍රික්කය තුළ මාර්ග ඉදි කිරීම වෙනුවෙන් එක් එක් වර්ෂය තුළ වෙන් කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඒ පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1289/'16

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් නැංවීමෙහිලා අතිශයින්ම තීරණාත්මක වූ අධිවේගී මාර්ග තැනීම, ඉකුත් රජයේ ප්‍රමුඛ සංවර්ධන මූලෝපායක් වූ බවත්;

(ii) ඒ අනුව, ඉදිවෙමින් පවතින මාතර - බෙලිඅත්ත අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් මේ වනවිට ඇරඹී ඇති අතර, ඒ සඳහා අවශ්‍ය ඉඩම් අත්කරගෙන ඇති බවත්;

(iii) මාතර, තිහගොඩ කොට්ඨාශයේ වන්දි තක්සේරු කිරීමේදී ඉඩම් හිමියන්ට යම් අසාධාරණයක් සිදුවී ඇති බවත්;

(iv) එහිදී අධිවේගී මාර්ගයට යාබදව ඉතිරිවන ඉඩම්වල වටිනාකම, පවතින වටිනාකමට සාපේක්ෂව අඩුවීම තක්සේරු කර නොමැති බවත්;

(v) දේපළ කොටසක් පමණක් පවරා ගැනෙන අවස්ථාවන්හිදී ඉතිරිවන කොටස ආන්තික ඉඩම් බවට පත්වීම සැලකිල්ලට ගෙන නොමැති බවත්;

(vi) කුඹුරු ඉඩම් පවරා ගැනීමේදී ගණනය කරනු ලැබූ, අනාගත වෘත්තීය අහිමිවීම, ගොඩ වගාවන් සඳහා ගණනය කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) සාමාන්‍ය මහා මාර්ගයක් පුළුල් කිරීමේදී, යාබද ඉඩම්වල වටිනාකම් ඉහළ ගියද, අධිවේගී මාර්ගයන්ට අදාළව එසේ නොවීම පිළිබඳ විශේෂයෙන් සලකා බලන විකල්ප වන්දි තක්සේරු ක්‍රමයක අවශ්‍යතාවය පිළිගන්නේද;

(ii) ඒ අනුව, තිහගොඩ, කපුදූව ප්‍රදේශයේ දේපළ සහ වගාවන් අහිමිවූවන්ට සහනයක් ලබාදීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1398/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැයෙහි අංක 168 යෝජනාව අනුව, කුරුඳු පුහුණු පාසැල් ව්‍යාප්ත කිරීම සඳහා වෙන් කළ රුපියල් මිලියන 50ක මුදල වැය කළ ආකාරය පිළිබඳ වැය විස්තරයක් ඉදිරිපත් කරන්නේද;

(ii) නොඑසේ නම්, ඒ මන්ද;

(iii) ශ්‍රී ලංකාව තුළ පිහිටුවා ඇති කුරුඳු පුහුණු පාසැල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසැල් පිහිටා ඇති ස්ථාන කවරේද;

(v) 2016 වර්ෂය තුළදී කුරුඳු පුහුණු පාසැල් තුළ පුහුණුව ලැබූ පුද්ගලයන්ගේ සංඛ්‍යාව සහ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

892/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තුලා වෙල්ලිය ග්‍රාමය ආශ්‍රිත දිවි ගෙවන "වන්නි සිංහල" නම්, ජන වර්ගය පිළිබඳව සමීක්ෂණයක් කර තිබේද;

(ii) උක්ත ග්‍රාමයට අමතරව මෙම ජන වර්ගය ජීවත්වන වෙනත් ග්‍රාම නිලධාරි වසම් කවරේද;

(iii) යුද සමයේදී විවිධ පීඩාවන්ට ලක්වූ මෙම ජනතාව දිවිගෙවන ගම්මානයන්හි මූලික අවශ්‍යතා අවම මට්ටමක පවතින බව පිළිගන්නේද;

(iv) එම පහසුකම් කඩිනමින් ලබා දීමට පියවර ගෙන තිබේද;

(v) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උක්ත ජනතාවගේ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

(iii) මෙම ජනතාවගේ සම්ප්‍රදායික උරුමයන් ආරක්ෂා කිරීමට රජය පියවර ගෙන තිබේද;

(iv) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1068/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවය කරන පණිවුඩකරුවන් ඒකාබද්ධ සේවයට අයත් බවත්;

(ii) පණිවුඩකරුවන් සෘජුව බඳවා ගැනීමට ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට බලයක් නොමැති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) 2016 වර්ෂයේදී ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට පණිවුඩකරුවන් බඳවා ගැනීම සඳහා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවසරය ලබා ගෙන තිබේද;

(ii) එසේ නම්, එම අවසරය ලැබුනු දිනය කවරේද;

(iii) එකී අවසරය ලබා දුන් ලිපියේ පිටපතක් සභාගත කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පණිවුඩකරුවන් බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණය පැවැත්වූයේ අතිරේක දුම්රිය සාමාන්‍යාධිකාරි (පරිපාලන) ගේ ප්‍රධානත්වයෙන්ද;

(ii) එසේ නම්, එකී සම්මුඛ පරීක්ෂණ පවත්වන අවස්ථාව වනවිටත් එකී නිලධාරියා වැඩ තහනමට ලක්ව සිටි බව පිළිගන්නේද;

(iii) වැඩ තහනමට ලක්වූ නිලධාරියෙකු සේවයේ යෙදී සිටින්නේ කෙසේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1238/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කය තුළ 1983 වර්ෂය වනවිට පැවැති මුළු මාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායින් තාර දමා තිබූ මාර්ග සංඛ්‍යාව සහ කි.මී. ප්‍රමාණය කොපමණද;

(iii) වර්ෂ 1983 සිට යුද්ධය නිම වනතුරු එම දිස්ත්‍රික්කය තුළ මාර්ග ඉදිකිරීම සඳහා පැවති රජයන් විසින් වියදම් කරන ලද මුදල, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) යුද්ධය නිම වීමෙන් පසු මෙම දිස්ත්‍රික්කය තුළ මාර්ග ඉදි කිරීම වෙනුවෙන් එක් එක් වර්ෂය තුළ වෙන් කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඒ පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1291/'16

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ ඇති මධ්‍යම රජයට හා පළාත් සභාවට අයත් වාරිමාර්ග ක්‍රම වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත (i) හි සඳහන් වාරිමාර්ග ක්‍රම මඟින් අස්වද්දනු ලබන මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) ඉහත (ii) හි සඳහන් කුඹුරු ඉඩම් ප්‍රමාණය, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2013 සිට 2016 දක්වා මධ්‍යම රජයට අයත් වාරිමාර්ග නඩත්තුව සඳහා හෝ ප්‍රතිසංස්කරණය සඳහා වැය කළ මුදල;

(ii) වර්ෂ 2013 සිට 2016 දක්වා මාතර දිස්ත්‍රික්කයට අයත් වාරිමාර්ග නඩත්තුව සඳහා හෝ ප්‍රතිසංස්කරණය සඳහා වැය කළ මුදල;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1435/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාත්‍යන්තර නියමයන්ට අනුකූල වීම සඳහා, ධීවර යාත්‍රාවලට සම්ප්‍රේෂණ උපකරණ (Transponders) සවි කිරීමට රජය විසින් කටයුතු කරන බව, 2016 අයවැය යෝජනා අංක153 හි සඳහන් කළ බව පිළිගන්නේද;

(ii) රජය විසින්, එසේ ලබා දෙන සම්ප්‍රේෂණ උපකරණවල සහ එක් යාත්‍රාවක් සඳහා ලබා දෙන සම්ප්‍රේෂණ උපකරණවල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) උක්ත අයවැය යෝජනාවට අනුව, 2016 වර්ෂය තුළදී, රජය විසින් සම්ප්‍රේෂණ උපකරණ ලබාදුන් ධීවර යාත්‍රා හිමියන්ගේ නාම ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1049/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ මහනගර සහා බලප්‍රදේශය තුළ පිහිටි පෞද්ගලික ගොඩනැගිලිවල පවත්වාගෙන යන අමාත්‍යාංශ කවරේද;

(ii) එම අමාත්‍යාංශ පවත්වාගෙන යනු ලබන ගොඩනැගිලි කවරේද;

(iii) එම ගොඩනැගිලිවල වර්ග අඩියක් සඳහා ගෙවනු ලබන බදු මුදල හා සේවා ගාස්තුව, එක් එක් ගොඩනැගිල්ල අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) මෙම ගොඩනැගිලිවල රථගාල් කිරීම සඳහා ඇති ඉඩ ප්‍රමාණයට ගෙවීමක් සිදු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කොළඹ මහනගර සභා සීමාව තුළ පිහිටි අමාත්‍යාංශ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ වෙත ගෙන යන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා අවශ්‍ය ගොඩනැගිලි ඉදිකරන්නේද;

(iii) කොළඹ මහනගර සභා සීමාවෙන් ශ්‍රී ජයවර්ධනපුර වෙත ගෙන යන හා ගෙන නොයන අමාත්‍යාංශ වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1239/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මන්නාරම දිස්ත්‍රික්කය තුළ 1983 වර්ෂය වනවිට පැවැති මුළු මාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායින් තාර දමා තිබූ මාර්ග සංඛ්‍යාව සහ කි.මී. ප්‍රමාණය කොපමණද;

(iii) වර්ෂ 1983 සිට යුද්ධය නිම වනතුරු එම දිස්ත්‍රික්කය තුළ මාර්ග ඉදිකිරීම සඳහා පැවති රජයන් විසින් වියදම් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) යුද්ධය නිම වීමෙන් පසු මෙම දිස්ත්‍රික්කය තුළ මාර්ග ඉදි කිරීම වෙනුවෙන් එක් එක් වර්ෂය තුළ වෙන් කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඒ පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1292/'16

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉකුත් රජය අඛණ්ඩව පවත්වාගෙන ගිය වී ගොවීන් සඳහා සහනාධාර ක්‍රමයට පොහොර ලබා දීමේ වැඩසටහන, වත්මන් රජය යටතේත් ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, 2013, 2014 හා 2015 වර්ෂවලදී මාතර දිස්ත්‍රික්කයේ වී ගොවීන් සඳහා රජයේ සහනාධාර මත නිකුත් කර ඇති පොහොර ප්‍රමාණය, එක් එක් වර්ෂය අනුව සහ එක් එක් පොහොර වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත (ii) හි සඳහන් ප්‍රමාණයන් ගොවිජන සේවා බලප්‍රදේශ අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) රජයේ පොහොර සහනාධාරය ලබා ගැනීමට ගොවීන් විසින් සපුරාලිය යුතු නිර්ණායකයන් කවරේද;

(v) 2014, 2015 හා 2016 වර්ෂයන්හි, මාතර දිස්ත්‍රික්කයේ රජයේ පොහොර සහනාධාරය සඳහා සුදුසුකම් ලැබූ වී ගොවීන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2017 අප්‍රේල් මස 07 වැනි සිකුරාදා
# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

893/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නැගෙනහිර පළාතේ, පානම ගම්මානයේ, ජීවත්වන සිංහල හා දෙමළ ජනතාව ඉතා සහජීවනයෙන් ජීවත් වන බවත්;

(ii) එම ජනතාවට තම මූලික අවශ්‍යතා ඉටු කර ගැනීමේදී ගැටලු රාශියකට මුහුණ දීමට සිදුවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) පානම ප්‍රදේශයේ ජනතාවගේ ජලය හා ඉඩම් ආශ්‍රිතව පවතින ගැටලු විසඳීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) උක්ත ජනතාවගේ සංස්කෘතික අනන්‍යතාවය හා පාරම්පරික උරුමයන් රැකගෙන ජීවත්වීම සඳහා රජය අනුග්‍රහ ලබාදී තිබේද;

(ii) එසේ නම්, ඒ කෙසේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1069/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යෝජිත කුරුණෑගල - දඹුල්ල දුම්රිය මාර්ගයේ ශක්‍යතා අධ්‍යයනය සිදු කිරීම ජාත්‍යන්තර තරඟකාරී මිල ගණන් කැඳවීමකින් තොරව චීන සමාගමකට පවරා තිබේද;

(ii) නොඑසේ නම්, පැවරීමට සැලසුම් කර තිබේද;

(iii) එම ශක්‍යතා අධ්‍යයනය මොරටුව විශ්වවිද්‍යාලයට හෝ වෙනත් දේශීය ආයතනයකට භාර නොදීමට හේතු කවරේද;

(iv) ඒ සඳහා ජාත්‍යන්තර තරඟකාරී මිල ගණන් කැඳවීමක් නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1240/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිලිනොච්චි දිස්ත්‍රික්කය තුළ 1983 වර්ෂය වනවිට පැවැති මුළු මාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායින් තාර දමා තිබූ මාර්ග සංඛ්‍යාව සහ කි.මී. ප්‍රමාණය කොපමණද;

(iii) වර්ෂ 1983 සිට යුද්ධය නිම වනතුරු එම දිස්ත්‍රික්කය තුළ මාර්ග ඉදිකිරීම සඳහා පැවති රජයන් විසින් වියදම් කරන ලද මුදල, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) යුද්ධය නිම වීමෙන් පසු මෙම දිස්ත්‍රික්කය තුළ මාර්ග ඉදි කිරීම වෙනුවෙන් එක් එක් වර්ෂය තුළ වෙන් කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඒ පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1293/'16

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ වගා කරනු ලබන කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඉහත (i) හි සඳහන් ඉඩම් ප්‍රමාණය, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත (i) හි සඳහන් කුඹුරු ඉඩම් ප්‍රමාණය සඳහා දියවර සැපයෙන ආකාරය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) වර්ෂ 2013 සිට 2015 දක්වා මාතර දිස්ත්‍රික්කයේ වාර්තා වූ වී අස්වැන්න එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත (iv) හි සඳහන් වී අස්වැන්න, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1437/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 160ට අනුව, පොල් ප්‍රවර්ධන කටයුතු ඇතුළු පොල් නිෂ්පාදන වැඩපිළිවෙළ සඳහා වෙන් කරනු ලැබූ රුපියල් මිලියන 250ක ප්‍රතිපාදන බෙදා දුන් ආකාරය ඉදිරිපත් කරන්නේද;

(ii) උක්ත යෝජනාවේම කොටසක් වශයෙන් ශ්‍රී ලංකාවට පොල් ආනයනය කිරීමට ඉඩ දෙනු ලැබුවේද;

(iii) එසේ නම්, ආනයනය කරනු ලැබූ පොල් ප්‍රමාණය හා ආනයනකරුවන්ගේ නම් කවරේද;

(iv) වර්ෂ 1977 සිට 2016 දක්වා ශ්‍රී ලංකාවේ පොල් නිෂ්පාදනය, පොල් නිෂ්පාදිත අපනයන සහ ඒවායේ වටිනාකම වගුවක් ආශ්‍රයෙන් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1241/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වව්නියාව දිස්ත්‍රික්කය තුළ 1983 වර්ෂය වනවිට පැවැති මුළු මාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායින් තාර දමා තිබූ මාර්ග සංඛ්‍යාව සහ කි.මී. ප්‍රමාණය කොපමණද;

(iii) වර්ෂ 1983 සිට යුද්ධය නිම වන තුරු එම දිස්ත්‍රික්කය තුළ මාර්ග ඉදිකිරීම සඳහා පැවති රජයන් විසින් වියදම් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) යුද්ධය නිම වීමෙන් පසු මෙම දිස්ත්‍රික්කය තුළ මාර්ග ඉදි කිරීම වෙනුවෙන් එක් එක් වර්ෂය තුළ වෙන් කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඒ පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1295/'16

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ ඇති රජයේ ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඉහත (i) හි සඳහන් ඉඩම් ප්‍රමාණය, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මාතර දිස්ත්‍රික්කයේ පදිංචිය සඳහා බෙදා දීමට හඳුනාගෙන ඇති රජයේ ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) ඉහත (iii) හි සඳහන් ඉඩම් ප්‍රමාණය එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මාතර දිස්ත්‍රික්කයේ පදිංචිය සඳහා ඉඩම් නොමැති ජනතාවට ඉඩම් ලබා දීම සඳහා පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) ඒ සඳහා ක්‍රියාත්මක වෙමින් පවතින හෝ ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන වැඩසටහන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1440/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රන්මිණිතැන්න ටෙලි සිනමා ගම්මානය නිර්මාණය කිරීමට වැයවූ මුදල කොපමණද;

(ii) ඒ සඳහා මුදල් සපයා ගත් මූලාශ්‍ර කවරේද;

(iii) 2015.01.01 සිට 2016.12.31 දින දක්වා ටෙලි සිනමා ගම්මානය ලබා ඇති ආදායම කොපමණද;

(iv) මෙහි පාලන කටයුතු සිදු කරන්නේ කවර ආයතනයක් විසින්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මෙම ගම්මානයේ සංවර්ධන කටයුතු සඳහා තවදුරටත් මුදල් යෙදවීමට රජය කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

920/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2011 සිට 2015 දක්වා කාලය තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් පැරණි යකඩ අලෙවි කිරීම සඳහා කටයුතු කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(iii) 2011 සිට 2015 දක්වා එක් එක් වර්ෂයේදී අලෙවි කළ යකඩ ප්‍රමාණයන් හා මිල ගණන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම යකඩ මිලදී ගත් පුද්ගලයන් සහ එක් එක් පුද්ගලයා විසින් මිලදී ගන්නා ලද යකඩ ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) වෙළඳපොළේ පැවති මිල ගණන්වලට වඩා අඩුවෙන් විකිණීම නිසා ශ්‍රී ලංකා වරාය අධිකාරියට සිදුවූ අලාභය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1061/'16

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) උතුරු සහ නැගෙනහිර පළාත්වල පසුගිය කාලයේ පැවැති යුද්ධය හේතුවෙන් ආබාධිත තත්ත්වයට පත් වූ බොහෝ දෙනෙකු සිටින බවත්;

(ii) මෙම පුද්ගලයන්ගෙන් සැලකිය යුතු පිරිසකගේ කශේරුකාවට සිදුවී ඇති හානිය හේතුවෙන් ඉනෙන් පහළ කොටස අප්‍රාණික වී ඇති බවත්;

(iii) අවතැන් වූ මෙම පිරිසගෙන් බොහෝ දෙනෙකු මේ වනවිට නැවත පදිංචි කර ඇති අතර තවත් පිරිසක් තවමත් නැවත පදිංචි කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) උතුරු සහ නැගෙනහිර පළාත්වල නැවත පදිංචි කරන ලද ජනතාවට රජයෙන් සහ රාජ්‍ය නොවන සංවිධානවලින් නිවාස සහ වැසිකිළි ඉදිකර දීමේදී ඉහත කී ආබාධිත පුද්ගලයන්ගේ නිවාසවලට ප්‍රවේශවීමේ හා වැසිකිළි භාවිතා කිරීමේ පහසුකම් කෙරෙහිද අවධානය යොමුකරමින් ඒ සඳහා සුදුසු අයුරින් ඉදිකළ නිවාස හා වැසිකිළි ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කොපමණ ප්‍රතිශතයකින්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1124/'16

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වත්මන් යහපාලන ආණ්ඩුව බලයට පත්වීමෙන් පසු ඌව පළාත තුළ පුද්ගලික බස්රථ සඳහා මාර්ග බලපත්‍ර ලබා දී තිබේද;

(ii) එසේ නම්, එලෙස මාර්ග බලපත්‍ර ලබාදී ඇති මාර්ග කවරේද;

(iii) එසේ මාර්ග බලපත්‍ර ලබාගත් පුද්ගලයන්ගේ නම් කවරේද;

(iv) ඒ සඳහා අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1278/'16

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015.10.01 දිනට අධ්‍යාපන සේවා නියුක්තයන්ගේ සමූපකාර සකසුරුවම් හා ණය දෙන සමිතිය සතුව පවතින සම්පූර්ණ මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) 2016.06.11 වනවිට එම සමිතිය සතුව තිබූ ස්ථිර තැන්පතු ප්‍රමාණය කොපමණද;

(iii) මේ වනවිට ඉහත කී සමිතියෙන් ණය අයදුම්කර ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම ණය අයදුම්කරුවන් අතරින්, ණය අනුමත වූ නමුත්, මෙතෙක් ණය මුදල් මුදා හැර නොමැති සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(v) එම ණය අයදුම්කරුවන්ට ගෙවිය යුතුව ඇති ණය මුදල්වල එකතුව කොපමණද;

(vi) එකී ණය අයදුම්කරුවන් වෙත ණය මුදල් මුදා හැරීම ප්‍රමාද වීමට හේතුව කවරේද;

(vii) ඉහත කී සමිතිය තම සාමාජිකයන් වෙත නිසි ලෙස ණය මුදල් මුදා හැරීමට නොහැකි තත්ත්වයකට පත්වී ඇති බව දන්නේද;

(viii) එසේ නම්, එම සමිතියේ මූල්‍ය පාලනය විධිමත් කිරීම සඳහා ඉදිරියේ දී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1319/'16

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පසුගිය දිනවල ඇතිවූ ජල ගැලීම්/නාය යාම් ආදී විපත් හේතුවෙන් විපතට පත්වූ පවුල් සඳහා මෙතෙක් එක් පවුලකට ලැබී ඇත්තේ රු. 10,000/- පමණක් බවත්;

(ii) එම විපත් නිසා හානියට පත්වූ දේපළ හා නිවාස සඳහා රජය ලබාදීමට පොරොන්දු වූ සහන එනම්, බඩු භාණ්ඩ සඳහා මුදල් සහ නිවාස ඉදිකර ගැනීම සඳහා විකල්ප ඉඩම් විපතට පත් වැසියන්ට මේ වනතෙක් ලැබී නොමැති බවත්;

(iii) එමෙන්ම, විපතට පත් රජයේ සේවකයන්ට මාස තුනක වැටුප්, පොලී රහිත ණය මුදලක් වශයෙන් ලබාදෙන බව පැවසුවද, එම ණය මුදල් මේ දක්වා ඔවුන්ට ලැබී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (iii) හි සඳහන් ණය මුදල රජයේ සේවකයන්ට ලබා දෙන්නේද; එසේ නම්, එම මුදල ලබා දෙන දිනය කවරේද;

(ii) විපතට පත්වූ පවුල් සඳහා ලබාදිය යුතු ඉතිරි මුදල් හා නිවාස ඉදිකර ගැනීම සඳහා ඉඩම් හා ආධාර ලබාදෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1347/'16

ගරු ලකී ජයවර්ධන මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) "ළඟම පාසල - හොඳම පාසල" වැඩසටහන සඳහා තෝරාගෙන ඇති උඩුනුවර මැතිවරණ කොට්ඨාසයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත (i) හි සඳහන් පාසල් කවරේද;

(iii) මේ වනවිට එම පාසල් අතරින් නව ගොඩනැගිලි ඉදිකිරීමට යෝජිතව ඇති පාසල් කවරේද;

(iv) එම පාසල්වල ඉදිකිරීමට යෝජිත ගොඩනැගිලි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) "ළඟම පාසල - හොඳම පාසල" වැඩසටහන යටතේ තෝරා ගත් පාසල් අතරින් ඉඩකඩ අවම තත්ත්වයේ පවතින පාසල් සඳහා ගොඩනැගිලි ඉදිකිරීමට යෝජනා වී නොමැති බව දන්නේද;

(ii) මෙම වැඩසටහන යටතේ ගොඩනැගිලි පහසුකම් ඉතා අත්‍යවශ්‍ය පාසල් සඳහා ගොඩනැගිලි ලබාදීමට කටයුතු නොකර ඇත්තේ මන්ද;

(iii) එම පාසල් සඳහාද ඉතා ඉක්මණින් ගොඩනැගිලි පහසුකම් ලබාදීමට පියවර ගන්නේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1349/'16

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ පාසල් දරුවන් සාමාන්‍යයෙන් වෘත්තීය පුහුණුවීම් සඳහා යොමුවීමට අධෛර්යමත් වන බවත්;

(ii) වර්තමානයේ ශ්‍රී ලංකාවේ ශ්‍රමික වෙළඳපොල ඉල්ලුම සපුරාලීමේදී තරුණ ප්‍රජාව සතු නිපුණතාවයන්ගේ නොගැලපීමක් පවතින බවත්;

(iii) දරුවන් විවිධ කුසලතාවයන් සඳහා පුහුණු කර, නව වෘත්තීය මාර්ගයන් කරා යොමු කිරීමේ දැඩි අවශ්‍යතාවයක් පවතින බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ප්‍රාථමික මට්ටමේ සිට තෘතීයික මට්ටම දක්වා පාසල් දරුවන්ගේ වෘත්තීය කුසලතා වර්ධනය කිරීමට පිටිවහලක් ලෙස, අධ්‍යාපන අමාත්‍යාංශයේ සහයෝගයද ඇතිව පාසල් විෂය මාලාවෙහි වෙනසක් කිරීමට අමාත්‍යාංශය පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?